765

ලාභදායීබව සහ තරඟකාරීත්වය, නිෂ්පාදන සමාගම් වල කාර්යසාධනය කෙරෙහි ඇති කරන බලපෑම.

(ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනයක්)

**Effect of Profitability and competitiveness on Performance of Manufacturing Companies.**

**(Case of Sri Lanka)**

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
13 AUG 2012
UNIVERSITY OF KELANIYA

ඩී. ආර්. කරුණානායක

**FGS/03/02/02/2006/01**

කැලණිය විශ්ව විද්‍යාලයේ දර්ශනපති (M. Phil) (ආර්ථික විද්‍යාව) පරීක්ෂණයෙහි අවශ්‍යතාවයක් පරිපූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධයකි.

ප්‍රවේශ අංකය: 765
වර්ග අංකය:

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

2009

## සංක්ෂිප්තය

1977 ආර්ථික ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ වල මූලික අරමුණ වූයේ ජාත්‍යන්තර ආර්ථිකය හා ඒකාබද්ධ වූ නිදහස් විවෘත ආර්ථිකයක් නිර්මාණය කිරීමයි. එහිදී අපේක්ෂා කළ එක් අරමුණක් වූයේ මෙරට නිෂ්පාදන ව්‍යවසාය වර්ධනය කර දේශීය හා විදේශීය වෙළෙඳපලට අවශ්‍ය භාණ්ඩ සැපයුම් කිරීමයි. එහිදී තීරණාත්මක සාධකයක් වූයේ නිෂ්පාදන සමාගම්වල ලාභදායිබව සහ තරඟකාරිත්වයයි. මෑත කාලයේ ලෝක ආර්ථිකය තුළ මෙරට නිෂ්පාදන සමාගම් ලාභදායිත්වය හා තරගකාරිත්වය හමුවේ කවර කාර්ය සාධන මට්ටමකට පත්වූයේ ද යන්න විමසා බැලීම වැදගත්ය.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ අපනයනය පෙරදැරි කරගත් කාර්මීකරණ ප්‍රතිපත්තියක් තුළින් මෙරට නිෂ්පාදන සමාගම් වල කාර්යසාධනය ලාභදායී බව සහ තරඟකාරිත්වය බලපා ඇති ආකාරය පිළිබඳව විග්‍රහ කිරීමයි.

බාහිරාවලෝකන ආර්ථික ප්‍රතිපත්තිය මෙරටට හඳුන්වා දීමෙන් පසුව මේ දක්වා කාලය තුළදී නිෂ්පාදන සමාගම්වල කාර්යසාධනයේ දී ලාභදායී බව සහ තරඟකාරිත්වය කොතෙක් දුරට වැදගත් වී තිබේද යන ගැටළුව ඉස්මතු වේ. එය අනෙකුත් ආසියාතික රටවල සමපාර්ශ්වයන් හා සසඳන කල මැනවින් අවබෝධ කර ගත හැකි ය. එයට හේතුව නම් නිදහස් වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය යටතේ ආසියාතු රටවල් කීපයක්ම පසුගිය කාලයේදී ආර්ථික වර්ධනයක් ළගාකරගෙන නව කාර්මික රටවල් බවට පත් වූ නිසාය.

මේ අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත ලබාගැනීම, මෙරට තෝරාගත් දේශීය නිෂ්පාදන සමාගම් වල තොරතුරු ආශ්‍රිතව කරගෙන සිදුකළ අතර, ද්විතීයික දත්ත ලබා ගැනීම කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ලැයිස්තුගත සමාගම් අත්පොත් වල දැක්වෙන සාරාංශගත වාර්තාවන් හා ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවන් ආශ්‍රිත කරගෙන සිදු කරන ලදි.

මෙම අධ්‍යයනයේ දී මතු වූ සීමාවන් වූයේ, තරඟකාරිත්වය තක්සේරු කිරීමේදී ඇති වූ ගැටළු, ගිණුම්කරණ සංකල්ප හා ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී විෂය බද්ධ ගැටලු සහ ලාභදායී බව ගණනය කිරීමේදී මූල්‍ය කළමණාකරණ ගැටළු ආදියයි.

මෙම අධ්‍යයනයේ දී නිගමනය වූයේ වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය යටතේ මෙරට නිෂ්පාදන සමාගම් සාර්ථක ලෙස නිෂ්පාදන ක්‍රියාවලියේ නිරත නොවී ඇති බැවින්, ලාභදායිබව හා තරගකාරිත්වය හමුවේ ඵලදායී කාර්ය සාධන මට්ටමක් දක්වා ගමන් නොකළ බවත් ය.